# දැන්වීමයි

## <u>කළමනාකරණ හා මුල්‍ය පීඨයේ ප්‍රථම වසර (2023/2024 ප්‍රවේශ වර්ෂය) ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ නේවාසික කාලය අවසන් වීම.</u>

මැද්දවත්ත පිරිමි නේවාසිකාගාරය, වැල්ලමඩම අංක 02 සහ 03 කාන්තා නේවාසිකාගාරය සහ පඹුරණ අංක 02 කාන්තා නේවාසිකාගාරයන්හි දැනට නේවාසිකව සිටින කළමනාකරණ හා මුල්‍ය පීඨයේ ප්‍රථම වසර (2023/2024 ප්‍රවේශ වර්ෂය) අධ්‍යයන කටයුතු හදාරන ශිෂ්‍ය කණ්ඩායමට අයත් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ 2024/2025 අධ්‍යයන වර්ෂයේ අවසාන සමාසික පරීක්ෂණ 2026.03.13 දිනෙන් අවසන් වීමෙන් පසු 2026.03.14 පෙරවරු 10.00 ට පෙර අදාළ උපශාලාධිපතිවරුන් දැනුවත්කර, තමන් වෙත භාර දුන් භාණ්ඩ සහිත කාමර නිසි පරිදි භාර දී, නේවාසික ලේඛනයේ අත්සන් කර, ශිෂ්‍ය වාර්තා පොතෙහි අයවීමක් නොමැති බවට සටහන් තබා ගැනීමෙන් පසු නේවාසිකාගාරයෙන් ඉවත්විය යුතු බව දන්වා සිටිමි.

**නවක ශිෂ්‍ය ශිෂ්‍යාවන් හට 2026.03.16 දින සිට ඉහත සඳහන් නේවාසිකාගාර වල නේවාසික පහසුකම් ලබා දීමට නියමිත බැවින් අදාළ නේවාසිකාගාරයන්හි කාමර 2026.03.14 සහ 15 දිනයන්හිදී පවිත්‍රතා කටයුතු සිදුකිරිමට ඇත. එම නිසා 2026.03.14 දින පෙරවරු 10.00 ට පෙර අදාළ නේවාසිකාගාරයෙන් ඉවත්විය යුතු බව දන්වා සිටිමි.**

**තවද, නේවාසිකාගාරය තුල පවතින ඔබගේ පුද්ගලික භාණ්ඩද එම දිනයේදීම ඉවත් කරගතයුතු අතර එදිනෙන් පසු එම පුද්ගලික භාණ්ඩ සඳහා විශ්වවිද්‍යාලය මගින් වගකීමක් ගනු නොලබන බව මෙයින් දැනුම් දෙමි.**

සහකාර ලේඛකාධිකාරි
ශිෂ්‍ය කටයුතු අංශය
2026.03.09

පිටපත - පීඨාධිපති/කළමනාකරණ හා මුල්‍ය පීඨය
ශාලාධිපති/ශාලාධිපතිනි
නියෝජ්‍ය ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය උපදේශක/කළමනාකරණ හා මුල්‍ය පීඨය
නියෝජ්‍ය ලේඛකාධිකාරි/කළමනාකරණ හා මුල්‍ය පීඨය
උපශාලාධිපති/මැද්දවත්ත පිරිමි නේවාසිකාගාරය
උපශාලාධිපතිනි/වැල්ලමඩම අංක 02 සහ 03 කාන්තා නේවාසිකාගාරය, පඹුරණ අංක 02 කාන්තා නේවාසිකාගාරය